# චුම්බන කන්ද පාමුල විශ්‍රාන්ති මිටියාවත

ඊ එම් ඊ ඩබ්ලිව් බුද්ධිකා ජිනේන්ද්‍රි කුමාරි ඒකනායක

සරසවි දේශපාලනයෙන් බැටකා සමාජ උකුසු ඇසින් පලා ගොස් හුදකලා වන අරණක විශ්‍රාන්තිය සෙවූ අපූරුවකුගේ කතා පුවතක් පිළිබඳව ජයතිලක කම්මැල්ලවීරයන් චුම්බක කන්ද තුළින් හෙළි දරව් කරනු ලබයි. සැබෑ ලෙසට ග්‍රන්ථ රචනයේ විශිෂ්ඨයෙකු ලෙස හැඳින්විය හැකි ජයතිලක කම්මැල්ලවීරයන්ගේ කතා පුවත තුළින් විදහා දැක්වෙන විශ්‍රාන්තිමය අත්දැකීම් මෙලෙස දිගහැරීමට බලාපොරොත්තුවේ.

මෙසේ සිනාසීමෙන් හා ඇඩීමෙන් සිංහයා මිනිස් සිතක දෙගිඩියාව පසක් කර ගත්තේ ය. තීරණ ගැනීමේදී මිනිසුන් මුහුණ දෙන අඩමානය ගැන වැටහීමක් ලබා ගත්තේ ය. සිතත් ගතත් පාලනය කරගත නොහැකි අවස්ථාවන්ට මිනිසුන් මුහුණ දෙන අයුරු අවබෝධ කර ගත්තේ ය. අල්පේච්ඡ ජීවිතයට,බණට භාවනාවට යොමු වී සිටින පැරණි සගයාගෙන් මෙන් ම බලයට කාම සුඛල්ලිකානු යෝගයට යොමු වූ සගයාගෙන් ද තම ජීවිතයට ලැබුනු දේ පිළිබඳව සතුටින් මෙන් ම දුකින් උපේක්ෂාවෙන් ද මෙනෙහි කරන්නට මේ ගල් තලාව කදිම යහනකි. භාවනා සුඛයට ද යහනාවක් වූ තවත් කදිම ගල් තලාවක් මේ වන අරණ තුල ඇත්තේ ය,දැස් හැර බැලූ ඔහු දුටුවේ හෝතඹුවන් දෙදෙනෙකි. ඔවුන් ගල්තලාවට දිව ආවේ සහන් එළියේ පෙම්කෙලන්නට බව වටහා ගත්තේ ය. හෝතඹුවෝ ගල් තලාව මත වනාන්තරයේ නිදහස පසුපස දුවන්නට වූහ....,ගල් තලාව මත දෑත් දෙපසට ඔබාගෙන වාඩි වී සිටින ඔහු මුහුණ ඔසවා උරහිස්වල ගැවෙන තඹවන් කෙසරු සොලවන්නට විය. මේ නිදහස් ඉරියව්වට දැන්නම් කිසිම දෙපාවකුගෙන් හෝ සිවුපාවකුගෙන් බාධාවක් නොවන්නේ ය....,පවුල් ජීවිතයක තෘප්තිය වන්නේ ස්ත්‍රියක හා රමණයේ යෙදීම නම් ඒ තෘප්තිය මා මේ වනාන්තරය තුළ තනිකඩව හිඳිමින් ම ලබා නොගන්නේ ද?....,"මට සැරයක් කන්දට ගිහින් බලන්ඩම හිතෙනව" "ඒ කියන්නේ ට්‍රිප් එකක්?" "ඔව් එහෙම හිතාගෙන යමුකෝ" කිසිවෙකු මෙහි වෙසෙමින් කාලයක් භාවනාවේ යෙදී ඇත...,මැටි පැලේ ඉස්තෝප්පුවේ බූරු ඇඳක දිගාවීගෙන මිදුලට බුලත් කෙළ විදිමින් සිටි වැඩිහිටියා කීවේ ය...,මිනිසා අත වූ පිහිය බිම තබා කොළ අත්ත ලණු පටෙහි එල්ලා දෑත් නළලට එක්කොට වටයක් කැරකැවෙමින් නමස්කාර කළේ ය...,ඒ අනුව ඔහු ඊළඟ දින තුන හතර හුඹස් මැටි සමඟ ගත කළේ ය.කුමන දෙවියකු දැයි කිව නොහැකි නමුත් අඩි දෙකක් උස කෙටි බෙල්ලකින් යුතු ,කට දෙපසින් පිටතට නෙරා ගිය උල් දත් දෙකක් සහ ලොකු ඇස් දෙකක් සහිත දේව පිළිමය නිර්මාණය විය...,අලුත් දෙවියන් පළමුවෙන් වන්දනා කළේ ඔහු ය...,සති පොළෙන් ගෙන එන පත්තරය දෙතුන් වරක් මුල සිට අගට කියෙව්වේ ය. හැන්දෑවේ අවට කඳු වළල්ල අඳුරෙන් වැසෙන විට ,රැහැයි හඬ පරද්දන්නට මෙන් සුළඟ සින්දු කියන්නට පටන් ගනී...,ලිවීම නවතා ටික වේලාවක් කල්පනා කරමින් සිටි ඔහු අවසානයට ලියවුණු වාක්‍ය හතර කපා දැම්මේ ය.පසුදින කන්ද බැස පහළ ගල් ලෙන වෙත ගිය ඔහු දේව රූපය ඉදිරියේ ඇහැළ මල් ගොන්නක් තබා බොහෝ වේලාවක් වැඳගෙන සිටියේ ය.ඔහු සටහන් පොතෙහි ලිව්වේ ය. මැටි බිත්ති වලට ඇසුණේ යහන් දඬු කෙඳිරි ගාන හඬත් ඔවුන් දෙදෙනාගේ තෘප්තිමත් සුසුම් හඬත් පමණි..,කුස පුරා පැසුණු කිතුල් රා බී ගත් ඔහු දඬු ඇඳට වැටුණේ ය.මධ්‍යම රාත්‍රිය පසු වන තුරු ඔහු තද නින්දේ පසු වූයේ සිහින සිනමාව රඟන අතර ම එය නරඹමිනි...,උඩුකය නිරුවත් දරුවන් දෙතුන් දෙනෙකු එළිමහනේ කිසියම් ක්‍රීඩාවක යෙදී සිටිනු පෙනේ. "හොඳයි අපි මෙහෙම අහමු ,භාවනාවෙන් මොනවද තමන්ට ලැබෙන්නේ? සිතට සහනයක්,ඔව් භාවනාවෙන් ලැබෙන ලොකුම දේ ඒක තමයි".

සැබෑ ලෙසට ම තරුණයෙකු සමාජ දේශපාලන බලපෑම් හමුවේ තම ජීවිතය ගෙන ගිය අයුරු දැක්වෙන කතා පුවත විශ්‍රාන්තිය අරඹයා ම නොනිමවුනද චුම්බන කන්ද වෘතාන්තය තුළින් ඉතා අපූරු වූ විශ්‍රාන්තිමය රටා ඉහත ආකාරයට පෙලගැස්සවිය හැකි වේ.

කම්මැල්ලවීර ජයතිලක (2010) චුම්බන කන්ද, විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය, 812, මරදන පාර, පුංචි බොරැල්ල.